

# 2003

# ශ්‍රී ලංකා ගුවන් හමුදාව
# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

පටුන


| | | |
|---|---|---|
| 1. | හැඳින්වීම | 02 - 03 |
| 2. | දැක්ම, මෙහෙවර | 03 |
| | අ. දැක්ම | 03 |
| | ආ. මෙහෙවර | 03 |
| 3. | අධ්‍යක්ෂ මණ්ඩලය සහ අනිකුත් විධායක පත්වීම් | 03 - 06 |
| 4. | ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කළමණාකාරිත්ව ව්‍යුහය | 07 |
| 5. | සේවක පිරිස් හා ශක්තිය | 07 |
| 6. | 2003 වර්ෂය සඳහා බඳවා ගැනීම් | 07 |
| 7. | 2003 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව | 08 |
| | අ. මූල්‍ය සමාලෝචනය | 08 |
| | ආ. මූල්‍ය පරිපාලනය | 08 - 10 |
| 8. | සමාප්තිය | 11 |
| 9. | කෙටි යෙදුම් | 12 - 13 |
| 10. | ඇමුණුම් | 14 |

## 1. හැඳින්වීම

2003 වර්ෂය ශ්‍රී ලංකා ගුවන් හමුදාව සඳහා ජාතිය ආරක්ෂා කිරීමේ මෙහෙයුම් තත්වයන් නොකඩවා පවත්වාගෙන යාමට හැකි වී ඇත. උතුරු හා නැගෙනහිර ආරක්ෂක හමුදාවන් ප්‍රවාහනය කිරිම, හමුදා මෙහෙයුම් සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය, අනතුරින් මියගොස් හෝ තුවාල සිදු වූ අය ඉවත් කර ගැනීම හා ගුවන් ගමන් නිරීක්ෂණය ආදිය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව ප්‍රබල ලෙස මැදිහත්ව කටයුතු කරන ලදි. එල්ටීටීඊ සමඟ යුද නතර කිරීමේ ගිවිසුමකට ඇතුළත් වීම හේතුවෙන් ගුවන් හමුදාවේ සහයෝගය සමීපස්ථ ගුවන් ආධාර ලබා දීම සීමා විය. පියාසර කිරීමේ හා වෙනත් ගොඩබිම පුහුණු කිරීම් නොකඩවා පවත්වාගෙන ගිය අතර ශික්ෂණයන් හා පෙර පුහුණු කිරීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදි. සියලුම සේවක කැපවීමේ හේතුවෙන් මුළු පියාසර පැය 14,937.43 ක් සිදු කළ හැකි වූ අතර මෙයින් පැය 9,410.20 ක් මෙහෙයුම් කටයුතු සඳහාත්, පැය 177.50 ක් වාණිජ කටයුතු සඳහාත්, පැය 5,349.33 ක් පුහුණු කටයුතු සඳහාත්, යොදා ගෙන ඇත.

එමෙන්ම, ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ගොඩබිමේ ආරක්ෂාව සපයාදෙනු ලැබූ අතරම ත්‍රිකුණාමලය, වව්නියාව, රටේ අනෙකුත් ප්‍රදේශවලට ප්‍රධාන මාර්ග ආරක්ෂාව හා ග්‍රාමීය ආරක්ෂණ කටයුතුවල නිරත විය.

2003 වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාව මගින් මහජන මුදල් වෙන් කිරිම පිළිබඳව සමස්ත විශ්ලේෂණයක් ඉදිරිපත් කොට ඇති අතර 2003 වර්ෂය මුලදී අපේක්ෂා කල අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ගුවන් හමුදාව විසින් එම මුදල් උපයෝගී කර ඇති ආකාරය පෙන්නුම් කෙරේ. පහත සඳහන් ආකාරයෙන් වාර්තාවේ අදාළ විස්තර දක්වා ඇත.

### අ. පළමු කොටස : වාර්ෂික කාර්ය සාධන වාර්තාව

(1) වාර්ෂික කාර්යසාධන වාර්තාව සකස් කොට ඇත්තේ 2003 වාර්ෂික අයවැය වාර්තාව සකස් වී ඇති ආකාරයෙන් වන අතර එමගින් එහි දක්වා ඇති ඉලක්කවලට එරෙහිව කාර්ය සාධනයන් වාර්තා කොට ඇත. එක් එක් කොටසක කාර්ය සාධනය පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් හා ඇගයීමක් කර ඇති අතර වර්ෂය තුළ දී ආරක්ෂාවට අදාළ කාර්යයන් පිළිබඳව අතිරේක පසුතල විස්තරයක් මගින් දක්වා ඇත.

(2) වාර්ෂික අයවැය වාර්තාව සකස් කොට ඇත්තේ දෙපාර්තමේන්තු සංවිධානය වී ඇති ආකාරයෙන් කාලයක් තුළ දී ඉස්මතු වෙමින් පවත්නා ඉහළ පෙළේ ප්‍රමුඛතාවන් හා වෙනස්විම් පිළිඹිබු වන ආකාරයෙනි. මේ හේතුවෙන් සමස්ත ව්‍යුහමය ඒකාකාර ලෙස පැවතියේ වුවද. අනිවාර්යයෙන්ම එක් අයවැය වාර්තා නමින් අයවැය වාර්තාවක් ඉහළ මට්ටමේ ආධාරක අභිප්‍රායන් හා ඒවා සම්බන්ධීකරණය කොට ඉදිරිපත් කරන ආකාරයෙන් එකී වාර්ෂික අයවැයෙන් ඊළඟ වාර්ෂික අයවැය එක්තරා ප්‍රමාණයකින් වෙනසක් සිදුවේ.

(3) ශ්‍රි ලංක ගුවන් හමුදාවේ අරමුණු එහි ඉහළම මට්ටමේ සිට, 2003 වර්ෂයේ ආරම්භයේ දී දක්වා ඇත. මෙසේ හෙයින් වාර්ෂික කාර්යසාධන වාර්තාව ආරම්භ වන්නේ 2003 වර්ෂයේ දී පිහිටුවා ගත් ඉලක්කවලට එරෙහිව 2003 දෙසැම්බර් 31 වන දිනට කාර්යසාධන සාරාංශය සමඟයි. වියදම් කිරීම පිළිබඳ විග්‍රහයක් වාර්තාව පුරාම දැක්වේ.

ආ. **දෙවන කොටස : 2003 දෙපාර්තමේන්තු විසර්ජන ගිණුම**

(1) වර්ෂය තුළ දී අත්පත් කරගත් තබාගත් හෝ යොදා ගනු ලැබූ සම්පත් හා ඒවා උපයෝගී කළ ආකාරය පිළිබඳව එක් එක් මුදල් වර්ෂයන් සඳහා දෙපාර්තමේන්තුව විසින් විසර්ජන ගිණුම් සකස් කළ යුතුවේ. මූල්‍ය රෙගුලාසි හා භාණ්ඩාගාර මාර්ගෝපදේශවලට අනුකූලව මුදල් පදනම් මත විසර්ජන ගිණුම් පිළියෙල කරනු ලැබේ.

(2) විසර්ජන ගිණුම මගින් ශුද්ධ සම්පත් ප්‍රතිඵලය, අභිප්‍රායන්ට අනුව සම්පත් යෙදවීම, පිලිගත් ලාභ හා පාඩු හා මුදල් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහයන් පිළිබඳව දෙපාර්තමේන්තුවෙන් කෙරෙනෙ කාර්යයන් සම්බන්ධයෙන් සත්‍ය හා සාධාරන දැක්මක් ඔවුන් විසින් ඉදිරිපත් කල යුතුය. විගණකාධිපති වරයා විසින් ගිණුම් විගණනය කරන අතර ඒවා සත්‍ය හා සාධාරන බවත් හා ඒවා නිසි පරිදි සකස්කොට ඇති බවත් විගණකාධිපති විසින් තහවුරු කරනු ලැබේ. 2003 වර්ෂය සඳහා විසර්ජන ගිණුම විගණකාධිපතිවරයාගේ සහතිකය සමග ඉදිරිපත් කොට ඇත.

**2. දැක්ම. මෙහෙවර**

**අ.** දැක්ම

දිවයිනේ භෞමික අඛණ්ඩතාව හා ස්වාධීන රාජ්‍යත්වයේ ස්වාධිපත්‍ය පූර්ණ සුරක්ෂණය කරමින්, ජාතියේ අභිලාෂයන් නිරතුරු ඉටුකරන, මනා නිපුණත්වයකින්, අධිෂ්ඨානශීලී බවකින් මෙන්ම නිර්මාණශීලී බවකින් යුක්ත වූ ගුවන් හමුදාවක් ලෙස පෙරට යාම

**ආ.** මෙහෙවර

තාක්ෂණික අති විශිෂ්ඨතාව පදනම් කොටගෙන, අධිශක්‍යතාවන් වර්ධනය කර ගැනීම මගින්, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මනා සූදානමත්, මෙහෙයුම් සාර්ථකත්වයත්, එහි සතු අති දක්ෂ මානව සම්පත හා විශේෂිත ගුවන් යානා සහ උපකරණ ඔස්සේ පවත්වා ගනිමින් ද, ජවය, වේගය සහ බලය නිවැරදිව ගගනගත මෙහෙයුම් වල දී යොදවමින් ද, වෘත්තීය ඵලදායිතා සුවිශිෂ්ඨතාව සාක්ෂාත් කර ගැනීම

**2. කළමණාකාරීත්ව මණ්ඩලය හා වෙනත් ප්‍රධාන පත්වීම්**

අ. අධ්‍යක්ෂ මණ්ඩලය

ගුවන් හමුදාව පාලනය කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය මගිනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් වන්නේ,

**ගුවන් හමුදාධිපති**

එයාර් මාෂල් ජී. ඩී. පෙරේරා VSV, USP, ndc, psc

**මාණ්ඩලික ප්‍රධානී**

එයාර් වයිස් මාෂල් ජේ එල් සී සල්ගාදු RWP, FAWC, ndc, qfi

**මෙහෙයුම් අධ්‍යක්ෂ**

එයාර් වයිස් මාෂල් ජේ එල් සී සල්ගාදු RWP,FAWC,ndc,qfi (01.12.2004 දක්වා)

ගුවන් කොමදෝරු ඩබ් ඩී ආර් එම් ජේ ගුණතිලක RWP,USP,ndc,psc (18.03.2003 සිට)

**සැළසුම් අධ්‍යක්ෂ**

එයාර් වයිස් මාෂල් ජේ එල් සී සල්ගාදු RWP,FAWC,ndc,qfi

**ගුවන් යානා ඉංජිනේරු අධ්‍යක්ෂ**

එයාර් වයිස් මාෂල් ඕ ඩී එන් එල් පෙරේරා RWP,USP,psc,ptmc,FI Diag E

**සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂ**

ගුවන් කොමදෝරු සී ඒ ගුණරත්න psc,MAIAA,AMRAeS

**විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂ**

ගුවන් කොමදෝරු ටී ඒ ටී එෆ් ඩබ් ගුණවර්ධන psc

**සැපයුම් සේවා අධ්‍යක්ෂ**

ගුවන් කොමදෝරු එල් එච් පීරිස් USP,psc

**පරිපාලන අධ්‍යක්ෂ**

එයාර් වයිස් මාෂල් ආර් අරුන්තවනාතන් RWP,RSP,USP,MSc (Def Studies), psc

**සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂ**

ගෘෘප් කපිතාන් කේ සමරතුංග USP,psc

**පුහුණු අධ්‍යක්ෂ**

එයාර් වයිස් මාෂල් එස් ආර් වීරසිංහ psc

**සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ**

ගුවන් කොමදෝරු එන් එච් ගුණරත්න USP, MBBS (Sri Lanka), DFM (Sri Lanka), D.Av.Med. (RCP London)

**සුභසාධන අධ්‍යක්ෂ**

ගුවන් කොමදෝරු ආර් එම් පී එච් දසනායක USP,B.V.Sc,MSc (Agri)

**සිවිල් පරිපාලන නිලධාරී**

කේ ඒ පෙරේරා SLAS

**ප්‍රධාන ගණකාධිකාරී**

ඩබ් ඩී ආර් වීරසුන්දර B.Com (Spl), HNCD, HNDA, MSc. (Management) PGDM .(ICA), Attorney at Law, LICASL

ආ. **විධායක පත්වීම්**

**විධායක දන්ත වෛද්‍ය නිළධාරී**

ගෲප් කපිතාන් ඒ එම් බී අමුණුගම BDS (Sri Lanka),FICCDE

**ප්‍රධාන විනය ආරක්ෂක නිළධාරී**

වින්ග් කමාන්ඩර් එස් රඹුක්වැල්ල

**විධායක උපකරණ වර්ගීකරණ පරීක්ෂක නිළධාරී**

ගෲප් කපිතාන් කේ ඒ ගුණතිලක RWP,RSP,psc

**විධායක කෘෂිකර්ම නිළධාරී**

එයාර් කොමදෝර් ආර් එම් පී එච් දිසානායක USP,B.V.Sc, MSc.(Agri)

**විධායක තොරතුරු තාක්ෂණ නිළධාරී**

වින්ග් කමාන්ඩර් ටී පී ජේ අමරසේන BSc (Gen)

**විධායක ගුවන් යානා ආරක්ෂක නිළධාරී**

ගෲප් කපිතාන් ඊ පී ජේ පී සිල්වා USP,MSc.(Def .Studies) psc

**විධායක තත්ව නිර්න නිරීක්ෂක නිළධාරී**

ගෲප් කපිතාන් ඊ පී ජේ පී සිල්වා USP,MSc,( Def .Studies) psc

**අණදෙන නිළධාරී ශ්‍රී ලංකා ස්වේච්ඡා ගුවන් හමුදාව**

ගුවන් කොමදෝරු එම් එච් කරන්නාගොඩ

**අණදෙන නිළධාරී ශ්‍රී ලංකා ගුවන් හමුදා කාන්තා පක්ෂාංගය**

ගුවන් කොමදෝරු එම් එච් කරන්නාගොඩ

**අණදෙන නිළධාරී ගුවන් ධාවන පථ නිර්මාණ පක්ෂාංගය**

වින්ග් කමාන්ඩර් ඒ පී අබේසේකර USP,psc

**උතුරු ගුවන් මෙහෙයුම් අණදෙන නිලධාරී**

ගෲප් කපිතාන් කේ ඒ ගුණතිලක RWP,RSP,psc

**පීඨාධිපති ශ්‍රී ලංකා ගුවන් හමුදා රෙජිමේන්තුව**

ගුවන් කොමදෝරු ආර් ඒ දයාපාල USP,psc

**විධායක ගුවන් ගමන් පාලන නිළධාරී**

ගෲප් කපිතාන් ඒ කුමරේසන්

## 4. ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කළමණාකාරිත්ව ව්‍යුහය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කළමණාකාරිත්ව ව්‍යුහය මෙම වාර්තාවේ ඇමුණුම් ''අ'' වශයෙන් ඉදිරිපත් කොට ඇත.

## 5. සේවක පිරිස් හා ශක්තිය

2003 දෙසැම්බර් 31 වන දිනට සේවක සංඛ්‍යා, තොරතුරු පහත වගු 1හි දක්වා ඇත.

| විස්තරය | අනුමත සේවක සංඛ්‍යාව | දැනට සිටින සේවක සංඛ්‍යාව | අතිරික්තය / පුරප්පාඩු |
|---|---|---|---|
| නිලධාරීන් | 1,230 | 1,046 | (184) |
| සෙසු නිලයන් | 19,061 | 18,195 | (866) |
| සිවිල් මාණ්ඩලික නිලධාරීන් | 17 | 6 | (11) |
| මණ්ඩලික නොවන සිවිල් සේවකයින් | 176 | 61 | (115) |
| සුළු සේවකයින් | 2189 | 2,658 | 469 |
| මුළු ගණන | **22,673** | **21,966** | **(707)** |

**වගුව: 1**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ 2003 වර්ෂය සඳහා දැනට සිටින සේවක සංඛ්‍යාවේ අනුමත සේවක සංඛ්‍යාවට වඩා 707ක පුරප්පාඩු තිබේ.

## 6. 2003 වර්ෂය සඳහා බඳවා ගැනීම්

ශ්‍රී ලංකා ගුවන් හමුදාව 2003 වර්ෂය සඳහා 1,509ක සේවක සංඛ්‍යාවක් බඳවාගෙන ඇති අතර එයින් 61 දෙනෙකු නිලධාරීන් ද, 1,448 ක් සෙසු නිලයන් ද වේ. නිලධාරීන් වර්ග දෙකක් වශයෙන් බඳවාගෙන ඇත. ඍජුව බඳවාගනු ලබන නිලධාරීන් ශ්‍රී ලංකා ගුවන් හමුදා කැඩෙට් නිලධාරීන් වශයෙන් ද සෙසු නිලයන් සාමාන්‍ය බඳවා ගැනීම් පටිපාටියට අනුව බඳවාගෙන ඇත. විස්තර පහත සඳහන් වගුවෙහි දක්වා ඇත.

| **බඳවා ගැනීම් වර්ගය** | | **වර්ෂය තුළ දී බඳවා ගැනීම් සංඛ්‍යාව** | | | |
|---|---|---|---|---|---|
| | | **නිත්‍ය** | **ස්වේච්ඡා** | **උප එකතුව** | **මුළු එකතුව** |
| නිලධාරීන් | ඉදුරාම බඳවා ගැනීම් නිලධාරීන් | 7 | 1 | 8 | **61** |
| | ශ්‍රී ලංකා ගුවන් හමුදා නිලධාරීන් | 42 | - | 42 | |
| | කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාල නිලධාරීන් | 11 | - | 11 | |
| සෙසු නිලයන් | ගුවන් භටයින් | 1,365 | 68 | 1,433 | **1,448** |
| | කාන්තා ගුවන් භටයින් | - | 15 | 15 | |
| | ගුවන් භට කාන්තා ඉදුරාම බඳවා ගැනීම/ කාන්තා ගුවන් භටයින් | - | - | - | |

**වගුව: 2**

## 7. 2003 වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව

### අ. **මූල්‍ය සමීක්ෂණය**

2003 වර්ෂය සඳහා මුළු ආරක්ෂක වියදම ලං.රු.මි. 8,104.98 ක් විය. සමස්ථ ආරක්ෂක වියදම් පාර්ලිමේන්තුවෙන් අනුමත ප්‍රතිපාදන හා මහා භාණ්ඩාගාරයේ පනවා තිබූ සීමාවන් ඇතුලත් විය.

### ආ. **මූල්‍ය පරිපාලනය**

(1) පුනරාවර්තන වියදම්

2003 වර්ෂය සඳහා ලං.රු.මි. 7,487.24 ක් ඇස්තමේන්තු කොට තිබුණි. මුළු වියදම් රජයේ වෙන් කිරීම් වලින් දැරීමට සැලසුම් කර තිබිණි. භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කරනු ලැබූ මුළු අපේක්ෂිත වියදම් මෙසේය.

| | ලං.රු.මි. |
|---|---|
| පුද්ගල පඩිනඩි | 3,039.71 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 4,447.53 |
| **මුළු එකතුව** | **7,487.24** |
| **සංශෝධිත (අතිරේක) පුනරාවර්තන ප්‍රතිපාදන** | **0.00** |

(2) **ප්‍රාග්ධන වියදම්**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සඳහා ප්‍රාග්ධන වත්කම් අත්කර ගැනීම සඳහා හැකියා වර්ධනය සඳහාත්, මුළු ප්‍රාග්ධන ආයෝජනය වශයෙන් ලං.රු.මි. 2,828.00 ක් සැළසුම් කරන ලදි. කෙසේ හෝ අතිරේක විධි විධාන සමඟ මහා භාණ්ඩාගාරය අනුමත කරන ලද මුළු ප්‍රාග්ධන මුදල වූයේ ලං.රු.මි. 2,828.00 කි.

මේ අනුව 2003 වර්ෂය සඳහා සංශෝධිත ප්‍රතිපාදන පහත සඳහන් අනුව වේ.

| | ලං.රු.මි. |
|---|---|
| මුලු ප්‍රතිපාදනය | 2,828.00 |
| අතිරේක ප්‍රතිපාදනය | 0.00 |
| **සංශෝධිත ප්‍රාග්ධන ප්‍රතිපාදනය** | **2,828.00** |

(අ) **ප්‍රාග්ධන වත්කම්, පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම.**

වර්ෂය තුළ දී ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම සඳහා ලං.රු.මි. 834.50 ක ප්‍රාග්ධන ප්‍රදානයක් මුලින් ඉල්ලා සිටින ලදි. අනතුරුව ලං.රු.මි. 153.50 වත්කම් පුනරුත්ථාපනය කිරීම සඳහා වෙන් කරනු ලැබීය. මේ අනුව 2002 වර්ෂයේ ප්‍රතිපාදන සමග සැසඳීමේ දී 2003 වර්ෂය සඳහා ප්‍රතිපාදන 34.51%ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ.

(ආ) **ස්ථිර වත්කම් අත්කර ගැනීම**

ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මුලින් බර යන්ත්‍රෝපකරණ ලබා ගැනීම සඳහා ප්‍රධාන වශයෙන් උපකරණ සහ දැව භාණ්ඩ සඳහා ලං.රු.මි. 1,993.50 ක් ස්ථිර වත්කම් අත්පත් කර ගැනීම සඳහා මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරන ලදි. අනතුරුව මෙම වෙන් කිරීම ලං.රු.මි. 153.50 ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීමට මාරු කිරීමත් සමග ලං.රු.මි. 1,840.00 ක් දක්වා අඩු වී ඇත. මේ අනුව වර්ෂය සඳහා වෙන් කිරීම 2002 වර්ෂය සමග සැසඳීමේ දී 1.71%කින් අඩු විය.

(3) **පුනරාවර්තන වියදම් ප්‍රවර්ග යටතේ ප්‍රතිපාදනවලට එරෙහිව වියදම**

| **අයිතම විස්තර** | **ශුද්ධ ප්‍රතිපාදන ලං.රු.මි.** | **වියදම ලං.රු.මි.** |
|---|---|---|
| පුද්ගල පඩිනඩි | 3,183.87 | 3,136.37 |
| වෙනත් පුනරාවර්තන | 4,303.38 | 3,076.23 |
| **එකතුව** | **7,487.25** | **6,212.60** |

**වගුව: 3**

(4) **වාර්ෂික විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රාග්ධන ප්‍රවර්ග යටතේ විධිවිධානවලට එරෙහි වියදම (එක් එක් විෂය ක්ෂේත්‍රය අනුව)**

| **ප්‍රාග්ධන වැය විෂය** | **අයිතම විස්තර** | **ශුද්ධ ප්‍රතිපාදන ලං.රු.මි.** | **වියදම ලං.රු.මි.** |
|---|---|---|---|
| | ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | | |
| 2001 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 55.00 | 51.75 |
| 2002 | පිරියත හා යන්ත්‍රෝපකරණ | 909.50 | 899.07 |
| 2003 | වාහන | 23.50 | 20.67 |
| | ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | | |
| 2101 | වාහන | 191.95 | 68.22 |
| 2102 | ලී භාණ්ඩ හා සවි කිරීම් | 28.00 | 27.99 |
| 2103 | පිරියත, යන්ත්‍රෝපකරණ හා උපකරණ | 417.50 | 144.55 |

| | | | |
|---|---|---|---|
| 2104 | ගොඩනැගිලි හා ව්‍යුහ | 330.00 | 280.52 |
| 2106 | වෙනත් | 872.55 | 399.61 |
| **මුළු එකතුව** | | **2,828.00** | **1,892.38** |

**වගුව: 4**

(5) **අත්තිකාරම් ගිණුමෙහි නියමකරන ලද සීමාවන් හා සත්‍ය තත්වය පහත පරිදි දැක්විය හැක.**

ශ්‍රී ලංකා ගුවන් හමුදාවට රාජ්‍ය සේවකයන්ට ණය ප්‍රදානය කිරීම සඳහා එක් අත්තිකාරම් ගිණුමක් ඇත. මේ වර්ෂය තුළ පනවා ඇති සීමාවන්ට අප විසින් අනුකූලතාව දක්වා ඇති අතර මේ ගිණුම පහත සඳහන් පරිදි වේ.

| විස්තරය | පවත්නා වර්ෂයේ නිර්දේශිත සීමාව (ලං.රු.මි. ) | පවත්නා වර්ෂයේ සත්‍ය (ලං.රු.මි. ) | වෙනස (ලං.රු.මි. ) |
|---|---|---|---|
| අංක 22401 අත්තිකාරම් ගිණුම ''බී'' | | | |
| උපරිම වියදම් සීමාව | 200.00 | 198.90 | 1.10 |
| උපරිම ලැබීම් සීමාව | 145.00 | 202.10 | (57.10) |
| උපරිම හර සීමාව | 735.00 | 591.00 | 144.00 |

**වගුව: 5**

(6) **2003 විසර්ජන ගිණුම**

2003 වර්ෂය සඳහා විසර්ජන ගිණුම ප්‍රධාන ගණකාධිකාරී/ගණන්දීමේ නිලධාරී වෙත 2004 අප්‍රේල් 23 වන දින ඉදිරිපත් කරන ලදි.


## 8. සමාප්තිය

2003 වර්ෂයේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව කාර්යක්ෂම ලෙස කාර්ය සාධනයේ නිරත වී ඇති අතර ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වැදගත් දායකත්වයක් ලබා දී ඇත. උතුරු හා නැගෙනහිර සේවාවේ යොදා ඇති හමුදාවන්ගේ මෙහෙයුම් සඳහා අවශ්‍ය සියලු කටයුතු සම්පාදනය හා කාර්ය සංවිධානය වෙනුවෙන් මගීන් 248,886 දෙනෙකු හා බඩු තොග ගෑම් 4,541,697 ක් ගුවන් මගින් ප්‍රවාහනය කරන ලදි. උතුරු හා නැගෙනහිර ගොඩබිම් සේවයේ යොදා ඇති හමුදාව සඳහා සාර්ථකව ආධාර සපයන ලදි. යුධ කටයුතු නතර කිරීමේ ගිවිසුම මගින් එම කාර්යයන්හි නිරත නොවීමේ හේතුවෙන් ප්‍රමිතීන් හා සූදානමට සිටීමේ මට්ටම වැඩි දියුණු කිරීම සඳහා එම කාලය පුහුණු කිරීම් කටයුතු සඳහාත් පෙර පුහුණු කටයුතු සඳහාත් යොදාගනු ලැබීය. ජාතික අර්බුදයන් වන සබරගමුව පලාතේ හා දකුණු පලාතේ ඇති වූ ජල ගැලීම් වලදී ගුවන් හමුදාව විසින් දෙනු ලැබූ නොමසුරු සහයෝගය රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන කීපයකම ප්‍රශංසාවට ලක්විය. ගොඩබිම ආරක්ෂක මූලස්ථාන / ඒකකවල හා මෙහෙයුම් පෙදෙස්වල ආරක්ෂාව ලබා දීමට අතිරේක වශයෙන් ප්‍රධාන මාර්ග ආරක්ෂාව සහ මොරවැව කච්පල් තුරේ, මාර්බල් බීච් පුවියරාසිකුලම්හි හට කණ්ඩායම් යොදවා ආරක්ෂාව සලසා දෙනු ලැබීය. තව ද ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සමස්ත ගුණාත්මක කළමණාකාරිත්ව ප්‍රමිතීන් ඉහළ මට්ටමකින් යොදා ගැනීම නොකඩවා සිදු කරනු ලැබූ අතර මේ හේතුවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සියලුම ඒකකවල කාර්යක්ෂමතාව වැඩි දියුණු විය.

**ABBREVIATIONS**

| | |
|---|---|
| **BA** | ශාස්ත්‍රවේදී උපාධිය |
| **BCO** | අයවැය පාලන නිලධාරී |
| **B.com** | වාණිජවේදී උපාධිය |
| **BSc** | විද්‍යාවේදී උපාධිය |
| **C Ad O** | සිවිල් පරිපාලන නිලධාරී |
| **CATCO** | විධායක ගුවන් ගමන් පාලන නිළධාරී |
| **C Ad O** | සිවිල් පරිපාලන නිලධාරී |
| **CEO** | විධායක බෝම්බ නිෂ්ක්‍රීය නිළධාරී |
| **CFSO** | විධායක ගුවන් යානා ආරක්ෂක නිළධාරි |
| **CIRE** | විධායක උපකරණ වර්ගීකරණ පරීක්ෂක නිළධාරී |
| **CITO** | විධායක තොරතුරු තාක්ෂණ නිළධාරී |
| **CLO** | විධායක නීති නිළධාරී |
| **CPM** | ප්‍රධාන විනය ආරක්ෂක නිළධාරී |
| **CPO** | විධායක මිලදී ගැනීමේ නිළධාරී |
| **CQAO** | විධායක තත්ත්ව පාලන නිළධාරී |
| **CRO** | ප්‍රධාන බඳවා ගැනීමේ නිළධාරී |
| **C of S** | මාණ්ඩලික ප්‍රධානී |
| **DA** | පරිපාලන අධ්‍යක්ෂ |
| **DAE** | ගුවන් යානා ඉංජිනේරු අධ්‍යක්ෂ |
| **DCE** | සිවිල් ඉංජිනේරු අධ්‍යක්ෂ |
| **Def** | ආරක්ෂක |
| **DETE** | විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අධ්‍යක්ෂ |
| **DGE** | සාමාන්‍ය ඉංජිනේරු අධ්‍යක්ෂ |
| **DHS** | සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ |
| **D Ops** | මෙහෙයුම් අධ්‍යක්ෂ |
| **DP** | සැළසුම් අධ්‍යක්ෂ |
| **DT** | පුහුණු අධ්‍යක්ෂ |
| **DW** | සුභසාධන අධ්‍යක්ෂ |
| **Eng** | ඉංජිනේරු |
| **HNDA** | ගිණුම්කරණය පිළිබඳ උසස් ජාතික පාඨමාලාව |
| **HNDC** | වාණිජ විද්‍යාව පිළිබඳ උසස් ජාතික පාඨමාලාව |
| **KDU** | කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය |
| **M.A. (London)** | ශාස්ත්‍රපති (ලන්ඩන්) |
| **MSc.** | විද්‍යාපති උපාධිය |
| **MIM(SL)** | ශ්‍රී ලංකා කළමණාකරණ ආයතනයේ සාමාජික |
| **Mgt** | කළමණාකරණය |

| | |
|---|---|
| **ndc** | ජාතික ආරක්ෂක විද්‍යාලයේ උපාධිධාරී |
| **PGDM** | කළමණාකරණ පශ්චාත් ඩිප්ලෝමාව |
| **qfi** | සුදුසුකම්ලත් පියාසර උපදේශක |
| **RWP** | රණ වික්‍රම පදක්කම |
| **RWRSP** | රණ වික්‍රම රණශූර පදක්කම |
| **SLAF** | ශ්‍රී ලංකා ගුවන් හමුදාව |
| **USP** | උත්තම සේවා පදක්කම |
| **VSV** | විශිෂ්ඨ සේවා විභූෂණ |
| **WWV** | වීර වික්‍රම විභූෂණ |


COMMANDER
Air Secretary
ADC
C of S
DO
DP
DAE
DGE
DETE
DL
DA
DCE
DT
DHS
DW
C Ad O
CA
CDO
CPM
CIRO
CAO
CITO
CFSO
CQAO
COVAF
COWW
COAFCW
AOCN
CMDTSLAFR
CATCO